# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2016 පෙබරවාරි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 පෙබරවාරි මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 110.8 ලෙස ගණනය කර ඇත. පෙබරවාරි මාසයේ දර්ශකය ජනවාරි මාසයේ දර්ශකය (112.0) හා සංසන්දනය කල විට 1.2ක දර්ශකාංක අඩුවීමක් හා ප්‍රතිශතයක් ලෙස 1.1 ක අඩුවීමක් වාර්තා වේ. මේ සඳහා ආහාර කාණ්ඩයේ වටිනාකමේ වෙනස 1.22% කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස 0.11% කින් වැඩිවීම බලපා ඇත.

2016 ජනවාරි මාසය හා සසඳන කල 2016 පෙබරවාරි මාසය සඳහා ආහාර කාණ්ඩයේ වටිනාකමේ වෙනස අඩුවීම සඳහා එළවළු, සහල්, අමු මිරිස්, ලොකුළූණු, රතුළූණු, අර්තාපල්, දෙහි, පොල් සහ පොල්තෙල් යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් කරවල, අළුත් මාළු, පැපොල්, සීනි, අඹ, සහ සුදුළූණු යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

2016 ජනවාරි මාසය හා සසඳන කල 2016 පෙබරවාරි මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනසෙහි 0.11%ක වැඩිවීමක් දක්නට ඇත. මෙම ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස වැඩිවීම සඳහා ‘නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන’ සහ ‘විවිධ භාණ්ඩ හා සේවා’ කාණ්ඩවල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේම ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’, ‘ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු’ සහ ‘සෞඛ්‍ය’ යන කාණ්ඩවල වටිනාකමේ වෙනසෙහි සුළු වැඩිවීමක් වාර්තා වාර්තා වී ඇති අතර ‘රෙදිපිළි හා පාවහන්’ සහ ‘ප්‍රවාහන’ කාණ්ඩ සඳහා වටිනාකමේ වෙනසෙහි සුළු අඩුවීමක් දක්නට ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2016 පෙබරවාරි මාසය සඳහා වාර්ෂික උද්ධමනය 1.7% ලෙස ගණනය කොට ඇති බවත්, පසුගිය ජනවාරි මාසය සඳහා එම අගය -0.7% ක් ලෙස වාර්තා වූ බවත් සඳහන් කලේය. 2015 පෙබරවාරි මාසයේ රජය විසින් ක්‍රියාත්මක කළ අතුරු අයවැය යෝජනාවෙන් LP ගෑස්, භූමිතෙල්, පෙට්‍රල්, ඩීසල්, බස් ගාස්තු සහ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය කිහිපයක මිල අඩුකිරීමෙහි බලපෑම මෙම වසරේ පෙබරවාරි මාසයේදී ඉවත්වීම නිසා 2016 පෙබරවාරි මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නවතම පාරිභෝගික මිල දර්ශකය වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013=100) 2015 ඔක්තෝම්බර් මස සිට අදාල ලිත් මාසය අවසන් වී 21 වන දින ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දුරකථන අංක: 011-2147001 / 011-2147020